දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXK/04/2021

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය ) 2021/08/..16
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-77/2021

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ජේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානින් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට අදාළ පාසල් දන්ත චිකිත්සක සේවාවේ II "අ" ඛණ්ඩයේ/ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021**

පාසල් දන්ත චිකිත්සක II "අ" ඛණ්ඩයේ/ II ශ්‍රේණියේ නිලධාරීන්, II ඛණ්ඩයට/ II ශ්‍රේණියට උසස්වී වසර තුනක් (03) ගතවීමට පෙර සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රිසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. **(විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය ඉංග්‍රිසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ)** විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගය සඳහා අයදුම් කල යුත්තේ පාසල් දන්ත චිකිත්සක II "අ" ඛණ්ඩයට/ II ශ්‍රේණියට පත්වීම් ලද හා මෙතෙක් එම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් පමණි.

**සැ.යු -: 2021/06/30 දින වන විට II ශ්‍රේණියට පත්කර අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මාවෙත එවීමට කටයුතු කරන්න.**

**03. අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපියේ අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයඳුම්කරුවන් විසින් සකස් කරගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අධ්‍යක්ෂ (විභාග) වෙත **2021/09/25** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. **තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවර තුනක්ද එවිය යුතුය.** ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01-04 දක්වාත් දෙවන පිටුවේ අංක 05-09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

## 04. විභාග ගාස්තු

I විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ.
අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා නිසිලෙස අවලංගු කළයුතුය.

II කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

## 05. විභාගයට ඇතුලත් කර ගැනීම.

I පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාල ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරනු ලබන හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 06. විභාග පරිපාටිය

මෙම විභාගය කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය. දෙපාර්තමේන්තු පරීක්ෂණය, ලිඛිත, වාචික සහ ප්‍රායෝගික වශයෙන් කොටස් තුනකින් යුක්තවන අතර, එක් එක් කොටස සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම කොටසකටම අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුය.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති යනුවෙන් හා මුදල් රෙගුලාසි යනුවෙන් විෂයන් දෙකකින් සමන්විත වන අතර විෂයන් දෙකටම ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුය.

එක්වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන්/ විෂයන් වශයෙන් පෙනීසිට මෙම විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් සඳහා අයදුම් කළ යුතුය.

## 07. විභාග නිර්දේශ මාලාව

### 07. 1 .1 විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය කාලය පැය (03) තුනකි. රචනා මාදිලියේ ප්‍රශ්න (08) අටකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100කි.

**විෂය නිර්දේශය**

01. ක්ෂේත්‍ර දන්ත චිකිත්සකයින්ට අදාල වන ස්ථාවර උපදෙස්, මෙයට මුදල් රෙගුලාසිවල සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අත් පොතේ I වන කොටසේ සඳහන් නිවාඩු, ලිපි හුවමාරුව සහ බඩු වට්ටෝරු ලේඛන පවත්වාගෙන යාම සම්බන්ධ රෙගුලාසි හා වෙනත් අදාල රෙගුලාසි පිළිබඳ දැනුමක් ඇතුලත් වේ.
02. සක්‍රිය දන්ත විද්‍යාව හා දත් ගැලවීමේ කාර්යය පිළිබඳ විස්තරාත්මක දැනුම.
03. ප්‍රාථමික සෞඛ්‍ය සත්කාරය පිළිබඳ විස්තරාත්මක දැනුම.
04. දන්ත සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ විස්තරාත්මක දැනුම.
05. මහජන සෞඛ්‍ය පිළිබඳ දැනුම.
06. දත් පිහිටීමේ ඇති මූලික අඩුපාඩු හඳුනා ගැනීමට ඇති හැකියාව.
07. දන්ත සෞඛ්‍ය පිළිබඳ දැනුම.
08. ප්‍රථමාධාර පිළිබඳ දැනුම.

**07.1.2 විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය**

විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණයකි. කාලය පරීක්ෂණය අනුව වෙනස්වේ. මුළු ලකුණු 100 කි.

**07.1.3 විෂයානුබද්ධ වාචික පරීක්ෂණය**

විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේදී මුහුණපාන ගැටලු පිළිබඳ වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. කාලය විනාඩි 15 කි. මුළු ලකුණු 100 කි.

**07.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**07.2.1 ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති මත සැකසේ. කාලය පැය 02කි. රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් (07) සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද**

| | | |
|---|---|---|
| XV වන පරිච්ඡේදය | - | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම |
| XVI වන පරිච්ඡේදය | - | නිවාඩු |
| XXIII වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධරයන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV වන පරිච්ඡේදය | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV වන පරිච්ඡේදය | - | වෘත්තීය සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහ |
| XXVII වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි |
| XXX වන පරිච්ඡේදය | - | රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXXIII වන පරිච්ඡේදය | - | නීති උපදෙස් සහ නීති ක්‍රියා මාර්ග |
| XLVII වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය පිළිබඳ නීති |

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති

### 07.2.2 මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 02කි. රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් (07) සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

**මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**

| | | |
|---|---|---|
| (1) VI වන පරිච්ඡේදය | - | ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්. (මු. රෙ. 315 සිට මු. රෙ. 396 දක්වා) |
| (2) XIII වන පරිච්ඡේදය | - | සැපයීම් වැඩ සහ සේවා: සැපයීම්/ මිලට ගැනීමේ ක්‍රියාවලිය. ගබඩා සමීක්ෂණ ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම. (මු. රෙ. 708 සිට මු. රෙ. 775 දක්වා) |

### 08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා ගෙන උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකි සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකි සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**09.** කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු සියලුම II ශ්‍රේණියේ/ II පන්තිය "අ" ඛණ්ඩයේ පාසල් දන්ත චිකිත්සක නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. (මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.)

**සැ.යු – මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

Chamod

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

EXK

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT -06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට**

**අදාළ පාසල් දන්ත චිකිත්සක සේවාවේ II "අ" ඛණ්ඩයේ/ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන**

**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021**

01. (අ) I. අයදුම්කරුගේ නම (සිංහලෙන්) -

..........................................................................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්) -

..........................................................................................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) I. II "අ" ඛණ්ඩයට/ II ශ්‍රේණියට උසස් කළ දිනය හා ලිපි අංකය:

**දිනය** ..........................................................................

**ලිපි අංකය** ......................................................................

II. දැනට ලබන වාර්ෂික වැටුප - .............................................................

III. ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

IV. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

V. විද්‍යුත් ලිපිනය - ..........................................................................

**02 ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.**

| | | | |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | ☐ | විෂයානුබද්ධ වාචික පරීක්ෂණය | ☐ |
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ☐ | විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය | ☐ |
| මුදල් රෙගුලාසි | ☐ | | |

03. (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්) -..........................................................................

(ඉංග්‍රීසියෙන්) -..........................................................................

(ආ) එම සේවා ස්ථානය අයත්වන්නේ - මධ්‍යම රජයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවේ නම්, අදාළ පළාත - ..........................................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ..........................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය සහ ප්‍රායෝගික/ වාචික පරීක්ෂණය දැනුම් දීමේ ලිපිය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද, 9"x4" ප්‍රමාණයේ රු. 45.00ක මුද්දර ඇලවූ ලියුම් කවර තුනක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ........................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන්)..........................................................................

..........................................................................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..........................................................................

..........................................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි )- ..........................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේද? ........................

| මුද්දර කොටුව |
|---|
| |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන බැවින් රු.................................,......ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි

දිනය .....................

..................................
අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ / නිලධාරිණියගේ සහතිකය**

මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය .......................

..................................
නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

........................................................මහතා / මහත්මිය / මෙනවිය ..................................
නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන / නොවන බවත් රු............... ක් වටිනා මුද්දර මෙම අයදුම් පත්‍රයට අලවා ඇති බවත් / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවත්* විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

දිනය ..................

.......................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(මුද්‍රාව තැබිය යුතුය )

09. **විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර*ප්‍රධානියාගේ සහතිකය**

..........................................................මහතා/මිය/මෙනවිය* II "අ" ඛණ්ඩයේ/ II ශ්‍රේණියේ පාසල් දන්ත කාර්මික චිකිත්සක නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ*සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තෙරෙතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට*සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

....................................................
විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර
ප්‍රධානියාගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය)

දිනය ....................

(*අනවශ්‍ය කොටස් කපා හරින්න.)